බුදු පිළිමය සංකේතයක් ද?

කේ. ජයතිලක

බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය පිළිබඳ ව උගතුන් අතර මතභේද පවතී. සමහරුන් බුදු පිළිමය ලාංකික කලා කරුවන්ගේ නිර්මාණයක් යැ යි කියන අතර තවත් සමහරු එය ඉන්දියානු කලා කරුවන්ගේ නිර්මාණයක් යැ යි කියති. ගාන්ධාරයේ බුදු පිළිමවල එන ග්‍රීක කැටයම් ලක්ෂණ සැලකූ අනෙකකු ගේ මතය මුල් බුදු පිළිමය ඉන්දියානුන් සඳහා ග්‍රීක ශිල්පීන් විසින් තනන ලද්දේ ය යනුයි.

කොසොල් මහරජු කළ ඉල්ලීමකට පිළිතුරු වශයෙන් බුදු පිළිම තැනීම බුදුන්වහන්සේ විසින් ම අනුඥා වදාළ බව කෝසළ වර්ණාව ඇතුළු පසු කාලයේ ලියැවුණු පොත් කිහිපයකම සඳහන් වෙයි. කොසොල් රජ මැදුරේ චිත්‍රාගාරයක් පැවැති බව විනය පිටකයේ සඳහන් වෙතත් එහි බුද්ධ චිත්‍ර හෝ ප්‍රතිමා පැවති බව ඔප්පු කරන පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් වී නැත.

මී ළඟට බුදු පිළිමය ගැන කියවෙන ආදීම අවස්ථාව හැටියට සැලකිය හැක්කේ මහා වංසයෙහි එන විස්තරයෙකි. දේවානම්පියතිස්ස රජු (ක්‍රි. පූ. 307 – 267) විසින් ථූපාරාම භූමියේ තැන්පත් කළ බුදු පිළිමයක් දෙවුනිස් රජු (ක්‍රි. ව. 267 – 276) විසින් පාචීන තිස්ස පබ්බතයෙහි තැන්පත් කළ බව එහි 36 වැනි පරිච්ඡේදයේ සඳහන් වෙයි.

මහා වංසයෙහි සඳහන් බොහෝ කරුණුවල සත්‍යතාවය පුරා විද්‍යාත්මක සොයා ගැනීම් වලින් ඔප්පු වී ඇත. එසේ වුවත් හය වැනි ශත වර්ෂයේ ලියැවුණු එයින් ඉන් අවුරුදු අටසියයකට පමණ ඉහත සිදු වූ හැම දෙයක් ම නිවැරදි ලෙස බලාපොරොත්තු වීම නොකළ හැක්කකි. බුදු සමය මෙ රටට පැමිණි අවදියේ ම මෙහි බුදු පිළිම තනන ලද්දේ නම්, එද, ඉන්දියාවෙන් පැමිණි බව සඳහන් වන ශිල්පීන් විසින් ම විය යුතු ය. බුදු පිළිමය ලාංකික ශිල්පීන්ගේ නිර්මාණයක් ය, එය මුලින් ම ලංකාවේ සාදන ලද්දක් ය යන මතය ආචාර්ය සෙනරත් පරණවිතාන විසින් ද බැහැර කරනු ලැබේ.

වේදකාලයේ බොහෝ දෙවිවරුන් සිටිනමුත් ඉන්දියාවේ ඔවුන්ගේ පිළිම වන්දනාවක් නොතිබිණි. එසේ වුවත් ඉන්දු නිම්නයේ නෂ්ටාවශේෂ අතර තිබී අඩුම වශයෙන් අවුරුදු තුන් දහසක්වත් පැරණි විවිධ පිළිම රාශියක් සොයා ගෙන ඇත. මේවා ආර්ය වුවත්, අනාර්ය වුවත් ඉන්දියාවේ පිළිම තැනීම බොහෝ කලක් සිට පැවති බව ඉන් ඔප්පු වෙයි.

ප්‍රස්තාවනාවක් වශයෙන් මේ කරුණු සඳහන් කෙළේවී නමුත් මේ ලිපියේ මුඛ්‍ය අදහස බුදු පිළිමයේ ආරම්භය සෙවීම නොව ඉන්

කුමක් අදහස් කරන්නේ ද යන්න සොයා බැලීම යි.

ක්‍රි. පූර්ව තුන් වැනි සිය වසේ සිට නිර්මාණය කරන ලද කැටයම් ඇතුළත් භාරුත්හි හා සාංචියේ බුදුන් වහන්සේ දක්විය යුතු තැන්වල උන්වහන්සේ ගේ රූ සටහන නොයොදා ඒ වෙනුවට සංකේතයක් යොදා ඇති බව පතළ කරුණකි. මෙසේ යොදා ඇති සටහන් නම් බෝධිය, සේසත, සිරිපතුල, වජ්‍රාසනය, චක්‍රය, බෝ කොළය, ස්ථූපය යනාදිය යි. මීට හේතුව වශයෙන් දක්වනුයේ බුදුන් වහන්සේගේ ශාරීරික ස්වරූපය දක්වීම උන්වහන්සේට කරන අගෞරවයක් හැටියට සැලකූ ශිල්පීන් ඒ වෙනුවට සංකේතයක් යොදන්නට ඇති බව ය. ප්‍රශ්නය වී ඇත්තේ මෙය ඒ ආකාරයට ම පිළිගත හැකි ද යන්න ය. පළමු කොට ම බුදුන් වහන්සේගේ ආකාරය දක්වීම අගෞරවයක් කොට පැරණි පොත්පත් වල කිසි තැනක සඳහන් නොවේ. පසු කාලයක ලියැවුණු පූජාවලිය, කෝසල බිම්බ වර්ණනා ආදී පොත් වලින් නම් පෙනෙන්නේ ඊට බුදුන්ගේ අනුමැතිය ද ලැබුණු බවයි. ඇරත් බුදුන්වහන්සේ මනුෂ්‍යත්වය ඉක්ම වූවකු හැටියට සැලකෙන්නට වූයේ කල්ගත වන්නට වූ පසුව ය. සංයුක්ත නිකායේ ජරාසූත්‍ර යෙහි බුද්ධ ශරීරයේ පහළ වූ මහලු ලක්ෂණ පිළිබඳ ආනන්ද හිමියන්ගේ විස්තරය පසු කාලයේ ලියැවුණු බුද්ධශරීර විස්තර සමඟ සසඳා බැලීමෙන් මේ බව මොනවට ඔප්පු වේ.

ඉන්දියානු ප්‍රතිමා කලාව විශේෂයෙන් ම විඥානවාදී එකකි. ඊ. බී. හැවල් ඔහුගේ පොත්පත් වල නිතර නිතර සඳහන් කර ඇති පරිදි ඉන්දියානු කලා කරුවා හැමවිට ම උත්සාහ කෙළේ වස්තුවක් නොව අදහසක් චිත්‍රයට හෝ කැටයමට නැඟීමට ය. මෙ බදුම අදහසක් ''ඉන්දියානු කලාවේ මූල ධර්ම'' නමැති පොතේ ඇස්. ඇන්. දස්ගුප්ත ද ඉදිරිපත් කරයි. ගස්, වැල්, ඉර, හඳ ආදී භෞතික වස්තූන් කැටයම් කිරීමේ දී ඔහු ඒවා ඒ ස්වරූපයෙන් ම කැටයම් කෙළේ ය. ඉන්දියානු දර්ශණය-සංකල්ප වලින් ගහණ වූවකි. මේ සංකල්ප කැටයමට නැඟීමේ දුෂ්කරත්වය ඔහු මග හැර ගත්තේ ඒවා සංකේතවලට නැඟීමෙනි. ලෝන් හර්ස්ට්, පරණවිතාන ආදීන් පවසන පරිදි ස්ථූපය පවා මෙ බදු සංකේතයකි. කිසියම් සංකල්පයක් චිත්‍රයට නැඟීමේ දී ඔහු ඒ වෙනුවට සංකේතයක් තෝරා ගන්නා ලද්දේ කවර අන්දමින් ද? කවද ව්‍යවහාරයට පැමිණියත්, මේ පිළිබඳ ඉඟිය සංකේත යන වචනයේ ම ඇතැයි සිතමි. සංකේත යන වචනයේ ''එකහත්වය'' යන තේරුම ඇත. කිසියම් සංකල්පයක එක් අංගයක් භෞතික වස්තුවක තවත් අංගයක් හා එකඟ වේ ද එකල ඒ එකහත්වය මත අර සංකල්පය ප්‍රකාශ කිරීම සඳහා ඒ වස්තුව සංකේතයක් කොට යොදනු ලැබේ. මේ අනුව ඇතා සාන්තියේ සංකේතයක් බවට පත් වූ සැටි සලකා බලමු. ගොවිතැන් කරන ජනතාවකට වැස්ස විශාල සාන්තියකි. වැස්ස ලැබෙන්නේ වැහි වළාකුළෙනි. කළු පාට ඇතා ද වැහි වලාකුළක් වැන්න. ඇතා වැහි වලාකුළේ ඥාතියෙකු බවත්, ආදි කාලයේ දී ඇතුන් ද පියාපත් ඇතිව වැහි වලාකුළු පරිද්දෙන් අහසේ පියාසර කළ බවත්, දැක්වෙන ජනකතා ඉන්දියාවේ සුලභ ය.

වළාකුළ කැටයමෙහි එතරම් පැහැදිලි අදහසක් දෙන පරිදි ඉදිරිපත් කළ නොහැකි ය. මී ළඟට කැටයම් කාරයා කෙළේ සාන්තිය හඳුන්වන සංකේතය හැටියට ඇතා යෙදීම යි. කළු පැහැය මංගල වර්ණයක් නොවන බැවින් සාහිත්‍යයේ දී සාන්තිය නඟවන සංකේතය ධවල හස්තියා විය.

පැරණි ඉන්දියානු කැටයම් ඉතා පරීක්ෂාකාරී ව බලනොත් සංකේත හැටියට සැලකිය හැකි හැම දෙයක්ම සංකල්ප නැඟවීමට යොදා ඇති බව පෙනේ. දම්සක් පැවතුම් සූත්‍රර දෙසීමේ කැටයමේ එන මුවන්ගෙන් හැඟෙන්නේ වනය යන අදහස ද යනාදී තැන් නැවත සලකා බැලිය යුතු ය යන්න අප අදහස ය.

මේ අනුව බුදු පිළිමයෙන් අදහස් කරන්නේ කුමක් ද? එය බුදුන්වහන්සේගේ රූපකායය ඇඟවීමේ සටහනක් නොවිය යුතු ය. සද්ධර්ම පුණ්ඩරික නම් මහායාන ග්‍රන්ථයෙහි එන එක් පුවතක් මෙසේ යි. දිනක් එක් බමුණෙක් බුදුන් වෙත එළඹ වන්දනාමාන කිරීම සඳහා අබැටක් පමණ ධාතුවක් ඉල්වීය. බුදුන් ඔහුට කියා සිටියේ බුද්ධ කායය ධර්ම කායයක් පමණක් බැවින් අබැටක් සාද ධාතුවක් නැති බව ය.

මෙහි සත්‍යාසත්‍ය තාවය කෙසේ වෙතත් රූප කායයට වඩා ධර්ම කායය උසස් කොට සැලකීමේ අදහස ප්‍රචලිතව පැවැති බව මෙයින් පෙනේ. කර්න් නමැති ශාස්ත්‍රඥයා බුදුන් ඉතිහාස ගත පුද්ගලයෙකු නොවේ යැයි කියා සිටියේ ද මෙබඳු තවත් අදහස් ප්‍රචලිතව පැවති බැවිනි.

සාංචියේ හා භාරුත්හි බුදුන් වහන්සේ දක්විය යුතු තැන්වල ඒ වෙනුවට ඉහත සඳහන් විවිධ සටහන් යොදන ලද්දේ උන් වහන්සේගේ රූප කායය පෙන්වීමට ද? එසේ නැතහොත් බුද්ධත්වය ප්‍රකාශ කිරීමට ද? සුපුරුදු සංකල්ප සංකේතයට නැඟීමට පුරුදුව සිටි කැටයම් කරුට බුද්ධත්වය පිළිබඳ අදහස අලුත් එකක් විය. එය ප්‍රකාශ කිරීමේ සම්මත සටහනක් නො තිබිණි. මේ නිසා ඔහු විවිධ අවස්ථාවල විවිධ සටහන් යෙදුවාට සැක නැත. ස්ථූපයට ද මුල් වූ සේසත සමඟර සංකේත වලට ද යෙදෙන්නට ඇත.

එහෙත් එය අධිශ්වරත්වය ප්‍රකාශ කිරීම සඳහා යොදන සංකේතය විය. අධිශ්වරත්වය හා බුද්ධත්වය යනු දෙකකි. විදුරස්න, චක්‍රය ආදියෙන් ද උවමනා කරන අදහස එසේම ප්‍රකාශ නුවුවාට සැක නැත. මේ සඳහා (දෙව්වරුන් පිළිබඳ වෙනත් සංකල්ප පරිද්දෙන්) මානුෂික පෙනුමෙන් යුත්, එහෙත් මනුෂ්‍ය රූපයට වෙනස් වෙනත් සංකේතයක් වූ බුදු පිළිමය නිපදවීමෙන් පසුව මේ විවිධ සටහන් යෙදීම අත්හැර දමන ලදී.

බුදු පිළිමය, බුද්ධත්වය හඟවන සංකේතයක් හැටියට භාවිතා වන්නට වූ මුල් යුගයේ කැටයම් අතර විවිධ අන්දමේ බුදු පිළිම දක්නට ලැබේ. අමරාවතියේ දක්නට ලැබෙන වෙනස් වෙනස් අන්දමේ බුදුපිළිම වලින් අපට තේරුම් ගන්නට ඇත්තේ මේ පිළිබඳ ව ඒ වන තුරු කලාකරුවන් අතර මේ සංකේතයේ නියම ස්වරූපය පිළිබඳ ව එකඟත්වයක් නොපැවති බවයි.